# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/35 - 2012 නොවැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2012.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### උතුරු මැද පළාතේ පළාත් සභාව

උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරනු ලබන පත් කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 154(ඊ)(1)(4) හා (5) වැනි වගන්ති අනුව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර, කරුණාරත්න දිවුල්ගනේ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම් කරන ලද බව මෙයින් නිවේදනය කරමි :-

| | | |
|---|---|---|
| 01. | ගරු එස්. එම්. රංජිත් සමරකෝන් මැතිතුමා | - 2012.09.24 වැනි දින සිට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා වශයෙන් |
| | අමාත්‍යාංශයේ ලේකම් | - ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ - ආර්. ජී. ආනන්ද කුලරත්න මහතා |
| 02. | ගරු එච්. බී. සේමසිංහ මැතිතුමා | - 2012.09.24 වැනි දින සිට උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන සහ නිවාස අමාත්‍යවරයා වශයෙන් (නිවාස විෂය 2012.10.24 වැනි දින සිට පවරා ඇත) |
| | අමාත්‍යාංශයේ ලේකම් | - ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ - ඩී. එම්. සී. කේ. චන්ද්‍රදාස මහත්මිය |
| 03. | ගරු කේ. එච්. නන්දසේන මැතිතුමා | - 2012.09.24 වැනි දින සිට උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන සහ සංචාරක කටයුතු අමාත්‍යවරයා වශයෙන් |
| | අමාත්‍යාංශයේ ලේකම් | - ශ්‍රී. ලං. ප. සේ. වි. ශ්‍රේණියේ - ඒ. එම්. ඩබ්. ඒ. අමුණුගම මහතා |
| 04. | ගරු ආර්. එම්. පී. බී. රත්නායක මැතිතුමා | - 2012.09.24 වැනි දින සිට උතුරු මැද පළතේ කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර හා පළාත් සභා කටයුතු අමාත්‍යවරයා වශයෙන් |
| | අමාත්‍යාංශයේ ලේකම් | - ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ - පී. කේ. ජයලත් මහතා |
| 05 | ගරු එස්. එම්. පේෂල ජයරත්න බණ්ඩාර මැතිතුමා | - 2012.09.24 වැනි දින සිට උතුරු මැද පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වශයෙන් |
| | අමාත්‍යාංශයේ ලේකම් | - ශ්‍රී. ලං. ප. සේ. I පන්තියේ - එන්. පී. පණ්ඩිතරත්න මහතා |

කරුණාරත්න දිවුල්ගනේ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2012 ඔක්තෝබර් මස 24 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

11 - 670/1

1A - PG 001428 — 335 (2012/11)

## උතුරු මැද පළාතේ පළාත් සභාව

### උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ අංක 32(1) වගන්තිය යටතේ, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කරුණාරත්න දිවුල්ගනේ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත නම් සඳහන් නිලධාරීන්, උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒ ඒ තනතුරු සඳහා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරමි :-

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ, ඒ. එම්. ඩබ්. ඒ. අමුණුගම මහතා, 2012.10.03 වැනි දින සිට නැවත නියමයන් කරනතුරු, උතුරු මැද පළාත් සමූපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ආර්. ජී. ආනන්ද කුලරත්න මහතා, 2012.10.01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ හා පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, පළාත් වාරිමාර්ග, ඉඩම්, පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ඩී. එම්. සී. කේ. චන්ද්‍රදාස මහත්මිය, 2012.10.03 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, කාන්තා කටයුතු, ප්‍රවාහන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, පී. කේ. ජයලත් මහතා, 2012.10.04 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, එන්. පී. පණ්ඩිතරත්න මහතා, 2012.10.03 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ආර්. කේ. ප්‍රේමසිරි මහතා, 2012.10.03 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සභාවේ, පළාත් සභා ලේකම් වශයෙන්,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ජී. ඩී. කීර්ති ගමගේ මහතා, 2012.01.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන හා පුහුණු) වශයෙන්,

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ, ඩී. එච්. එම්. එන්. පී. දසනායක මහත්මිය, 2012.01.02 වැනි දින සිට 2012.10.02 වැනි දින දක්වා වූ කාල සීමාව සඳහා උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එච්. එම්. වී. එස්. ජයවර්ධන මහත්මිය, 2012.01.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. ඒ. ඩී. ගුණවර්ධන මහතා, 2012.01.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. ඒ. ඩී. ගුණවර්ධන මහතා, පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී කටයුතුවලට අමතරව, 2012.04.24 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු උතුරු මැද පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ටී. එම්. කේ. බී. ප්‍රේමතිලක මහතා, 2012.01.02 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක මහතා, 2012.04.18 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ බැඩ බැලීම සඳහා,

14. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II/II වැනි පන්තියේ, එච්. එම්. ජයන්ත හේරත් මහතා, 2012.08.30 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (වාරිමාර්ග) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා,

15. ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සේවයේ, වී. එස්. කේ. සුභසිංහ මහත්මිය, 2012.09.13 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා,

කරුණාරත්න දිවුල්ගනේ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2012 ඔක්තෝබර් මස 24 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

11 - 670/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.